# රාජ්‍යත්වය සහ රාජ්‍යය තුළ භාවිත ජ්‍යෝතිෂ්‍ය

**කුඩාවැවේ සෝමානන්ද හිමි**

ජ්‍යෝතිෂ්‍ය සාමාන්‍ය ජනතාව පමණක් නොව රාජරාජ මහාමාත්‍යාදීන් පවා සැලකිළිමත් වූ විෂයයකි. ජ්‍යෝතිෂ්‍ය සංකල්ප මෙන්ම එහි භාවිතයන් රාජ්‍යයෙහි හා රාජ්‍යත්වයේ කටයුතු තුළින් බැහැර වූයේ නොවේ. රාජ්‍යත්වය, අභිෂේකය ආදී නොයෙකුත් අවස්ථාවන්හි දී ජ්‍යෝතිෂ්‍ය භාවිත කොට තිබේ. ඉපැරණි අවධියේ සිටම රාජත්වය කෙරෙහි ද රාජ්‍යය කෙරෙහි ද යන විවිධ අංශවලට ජ්‍යෝතිෂ්‍ය විෂය බලපෑම් කර තිබේ.

රාජත්වය මෙන්ම රාජ්‍යය තුළ ප්‍රබල භූමිකාවක් ඉටු කළ අයෙකු හැටියට පුරෝහිත තනතුර ගෙනහැර දැක්විය හැකි ය. මොහු විවිධ චාරිත්‍ර වාරිත්‍ර ආදිය මෙන්ම ජ්‍යෝතිෂ්‍ය යොදා ගැනෙන අවස්ථාවල දී කටයුතු කරන ලදි.

ශ්‍රී ලාංකේය සමාජයේ බ්‍රාහ්මණයා සම්බන්ධ නොයෙකුත් කාර්යයන් අතර ඔහුට රාජ්‍ය අනුශාසකවරයා ලෙස කටයුතු කිරීමට ද ඉඩ ප්‍රස්තාව ලැබුණි. එනම්, පෙරවි බමුණා නැතහොත් පුරෝහිත තනතුර භාරගත් පුද්ගලයා වීම හේතුකොටගෙනය. සාහිත්‍යය මූලාශ්‍ර මඟින් මොහු විවිධ අයුරින් හඳුන්වා ඇති සිංහල ශබ්දකෝෂයේ ‘පෙරවිකම’[1], යනුවෙන් ද ‘පෙරවිකන්’[2], ‘පෙරවිදෑ’[3], ‘පෙරවි බමුණා’[4] යනුවෙන් අමාවතුරේ සහ සද්ධර්මරත්නාවලියේ ද ‘පෙරවියා’,‘පෙරෙවියා’[5] යනුවෙන් රුවන්මලේ ද සඳහන් වෙයි. මේ සෑම වචනයකින්ම වාගේ ගෙනහැර පානු ලබන්නේ පුරෝහිත බ්‍රාහ්මණයා රජුගේ අග්‍ර උපදේශක, ප්‍රධාන අනුශාසක, පුරෝහිත තනතුර දරන්නා යන්නයි.

ඓතරේය බ්‍රාහ්මණයෙහි යාග පූජාවක් පැවැත් වීම උදෙසා සෑම රජෙකුට ම පුරෝහිතයකු සිටිය යුතු බව කියැ වේ. එසේ නොවුනහොත් දෙවියන් එම පූජාවන් පිළි නොගනී. මහාසුපින ජාතකය[6] වැනි ජාතක කථා තුළින් අයහපත් සිහින නිසා රජුට වන

අයහපත් තත්ත්වයන් පුරෝහිත විසින් යාග පූජා පවත්වා දුරු කළ යුතු බව පෙනෙයි. එහෙයින් පුරෝහිත තැනැත්තා උදෑසනම රජු හමුවීම කළ යුතු වේ. ඉන් අනතුරුව රජුගේ යුද්ධායුධ ද මංගල හස්තියා මෙන්ම මංගල අශ්වයා ද අයත් අශුභ පල මන්ත්‍ර මඟින් දුරු කළ යුතු ය. මෙමඟින් ගම්‍ය වනු ලබන්නේ රජුගේ බොහෝ කාර්යයන් පුරෝහිත බමුණා ගේ උපදෙස් මත සිදු කෙරෙන බවක් ය.

ශ්‍රී ලංකාවේ පුරාතන අවධියේ සිටම බ්‍රාහ්මණයන් විසූ බවට සාහිත්‍යය හා විශේෂයෙන්ම අභිලේඛන වැනි පුරාවිද්‍යාත්මක සාක්ෂි ලැබීමෙන් පෙනෙයි. ලක්දිවට බුදුදහම ලැබීමට පෙර සහ පසුව පෙරවියන් ස්වකීය කාර්යයන් සඳහා රජවරු තබාගෙන සිටියෝ ය. ඒ අනුව ආදීම යුගයේ සිට ම බමුණා පුරෝහිත කාර්යයෙහි යෙදී සිටියේ ය.

මහාවංසය අනුව විජය විසින් පුරෝහිත[7] තනතුරෙහි යොදා ගත්තේ උපතිස්ස නැමැති බ්‍රාහ්මණයා ය. මොහු උපතිස්ස ග්‍රාමය ඉදිකළා පමණක් නොව විජයගෙන් පසු කෙටි කාලයක් රාජ්‍යය විචාරීමේ කාර්යයෙහි පවා නියැළී ඇත.[8] මේ තුළින් පැහැදිලි වන්නේ මෙම අවධියේ බ්‍රාහ්මණ පුරෝහිතයකුට සමාජයේ ඉහල තත්ත්වයක් පැවැති බවත් ඔහු සමාජයේ පමණක් නොව රාජ්‍ය පාලන කාර්යයෙහි නියැලීමට පවා වඩා වැදගත් කමක් ඉසුලූ බවත්ය.

මීළඟ පාලකයා හැටියට එන පණ්ඩුවාසුදේව රජුගේ රාජ්‍ය සභාවේ මන්ත්‍රයෙහි පාරප්‍රාප්ත බමුණෝ සිටි බව සඳහන් වෙති.[9] එම පිරිසෙහි එතුමාගේ පුරෝහිත බමුණා සිටියා විය හැක. එසේ වුවහොත් රාජ්‍යාභිෂේක කටයුතු ආදියත් පුරෝහිත තනතුරෙහි කාර්යභාරය ඔහුගෙන් ඉටුවුණා විය හැක. පණ්ඩුකාභයගේ රාජ්‍ය කාලයේ විශාල කාර්යභාරයක් පැවැරී තිබුණේ පණ්ඩුල බමුණාටය. ඔහුගේ පුත්‍ර චන්ද්‍ර නමැත්තා පණ්ඩුකාභයගේ රාජ සභාවේ පුරෝහිත තනතුරට පත් කළේය.

ක්‍රි. පූ. තුන්වැනි සියවසෙන් පසු බ්‍රාහ්මණයන් ලබා තිබූ තත්ත්වයට ප්‍රබල බලපෑමක් මහින්දාගමනයත් සමඟ ඇතිවෙන බව පැහැදිලි ය. මීට පෙර රජුගේ අනුශාසකයා, උපදේශකත්වය වැනි

නොයෙකුත් කාර්යයන් කළ බ්‍රාහ්මණ පුරෝහිතයාගේ තත්ත්වය පසුබැමකට ලක් වූ බව පැහැදිලිව පෙනෙන කාරණයකි. ඒ අනුව පෙනීයන්නේ, රාජ්‍ය පාලකයා විසින් ඉතාම සමීපව භික්ෂුව අශ්‍රය කිරීමට අපේක්ෂා කළ බවත් නිරතුරුවම උපදේශකත්වය, අනුශාසකත්වය භික්ෂුවගෙන් ලබාගත් බව ය. රොබට් ලින්ගා[10] බ්‍රාහ්මණික පුරෝහිතගෙන් ඉටු වුණු සේවයට සමාන වූ සේවයක් භික්ෂූන්ගෙන් රජු වෙත ඉටු වුණු බව පවසයි.

හඟුරන්කෙත ධීරනන්ද හිමියෝ භික්ෂූන් පාලකයන් සමඟ සමීපව වාසය කිරීමත් නොයෙකුත් උපදෙස් ලබාදීමට කටයුතු කිරීමත් යන්න මත පුරෝහිතගෙන් ඉෂ්ට වුණු කාර්යයන් භික්ෂුවගෙන් ඉටු වුණි යැයි සිතීමට අවකාශ ඇති බව පවසති.[11]

ලක්දිව ජනජීවිතයෙහි යම්කිසි වැදගත් කර්තව්‍යයක් ඉටුකරනු ලැබුයේ සුබ නැකත් දිනයක නැතිනම් සුබ සම්මත දිනයක දී ය. ඒ අනුව අභිෂේකය හා සබැඳි චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීමේදී ද සුබ සම්මත දිනයකට අනුව සිදුකළ බව මුල් අවධියේ සිටම පෙනෙන කරුණකි. ක්‍රි. පූ. තුන්වන සියවසට පෙර අභිෂේකය සිදුකරනු ලැබූ සම්මත දිනයක් පැවැති බවට සාධක දක්නට නොලැබේ. එහෙත් දේවානම්පිය තිස්ස රජුගේ නැවැත අභිෂේකයත් සමඟ ඒ සඳහා සම්මත දිනයක් ඇරඹුණු බව පෙනෙයි. එවක සිට අභිෂේක මංගල දිනය වශයෙන් වෙන් කර ගත්තේ වෙසක් දිනය යැයි කරගම්පිටිගොඩ සුමනසාර හිමියෝ පවසති.[15] මෙම චාරිත්‍රය පොළොන්නරුවේ රජ කරන ලද පළමුවැනි පැරකුම්බා කාලය තෙක්ම පැවැති බවක් සාරත්ථදීපනී[16] විනය ටීකාවෙහි එන පරිදි පැහැදිලි වෙයි. රජු කවර දිනෙක රාජ්‍යයට පත් වුවද අභිෂේක මංගල්‍යය සම්මත දවස්වලම පැවැත් විය. නමුත් වෙසක් පොහෝ දිනකම අභිෂේකය පැවැත් වූ බවක් සඳහන් කළ හැකි නොවේ. මක්නිසාදයත් ඊට පරිබාහිර දිනයන්හි ද මෙම කර්තව්‍යය ඉටු වී ඇති හෙයින් ය. ඒ අනුව සහස්සමල්ල සෙල්ලිපියෙහි සුභ නැකැත් මොහොතින් රාජාභිෂේකය කරන ලද බවක් පවසයි.[17] එම අභිෂේකය කැරැවූයේ බිනෙර පුර දොළොස්වක බදාදා දිනයක දී ය.[18]

පළමුවැනි පරාක්‍රමබාහු අභිෂේකය ද පැවැත්වූයේ සුභ නැකැත් දිනයක සර්වාභරණයෙන් සැරසී හිසෙහි කිරීට පැළඳ වීමෙන් ය.[19] මෙම

උත්සවය උසස් ආකාරයෙන් පැවැත්විණි. සර්වාභරණයෙන් සැරසුණු රජු ඇතුන් යොදා සකසන ලද අලංකාර ස්වර්ණමය මණ්ඩපයකට නැඟ, මැණික් යොදා කරන ලද කිරීටය හිසෙහි පළඳවාගෙන නගර ප්‍රදක්ෂිණා කොට සුභ මොහොතින් මාලිගාවට ප්‍රවිෂ්ඨ වූ බව සඳහන් වේ.[20]

රාජ්‍ය පදප්‍රාප්ත කුමාරවරුන් සතු වූ භාණ්ඩ අතර ප්‍රධානතම භාණ්ඩයක් වන්නේ සිංහාසනයයි. සිංහල රජුගේ බලයෙහි රාජකීය සංකේතය[21] හැටියට සිංහාසනය දැක්විය හැක. සිංහයා ශූර වීර වික්‍රමයෙහි සංකේතයක් බව පැහැදිලි ය. ඒ නිසා ගෛගර් මහතා වැතිර සිටි සිංහයෙකු නිරූපිත ශෛලමය ආසනයක් රාජාසනය හෙවත් සිංහාසනය විය හැකි යැයි අදහස් කරයි.[22] අභිෂේක අවස්ථාවේ සුභ මොහොතින් සිංහාසනාරූඪ ද විය.[23] නිශ්ශංක මල්ල රජුට අයත් ලිපියක් සහිතව මෙබඳු අසුනක් දක්නට ලැබෙයි. මන්දාරම්පුර පුවතෙහි ''කිරුළ සුභ මොහොත පළදාවිදි ලෙසින'' යනුවෙන් සඳහන් වීමෙන් එකල ද මෙය පැවැතිණි.

මහනුවර අවධිය දක්වාම රාජකීය කටයුතු සුභ මොහොතකට අනුව කරන බවක් දක්නට ලැබේ. මෙවක අභිෂේක චාරිත්‍ර යම්කිසි ආකාරයකින් වෙනසකට ද ලක් වේ. සියලු ආභරණවලින් සැරසුණු රාජ්‍ය අපේක්ෂකයා සිංහාසනාරූඪ වීමෙන් අනතුරුව සුභ මොහොතින් තිරය ආවරණය කර ඇති සිංහාසනය විවෘත වෙයි. ඉන් අනතුරුව විවිධ පාර්ශ්වයන් විසින් අචාර කළ පසු මාලිගා පිටියේ දී සුභ නැකතින් උත්සවශ්‍රීයෙන් අභිනව රජුට කඩු පළඳ වනු ලබයි. මෙම කඩු පැළඳ වීම උසස්ම චාරිත්‍ර විධිය වේ.

රජු හා සම්බන්ධිතව ජ්‍යෝතීර් විද්‍යා සංකල්ප රාශියක් බද්ධ වී ඇති අතර ඒ පිළිබඳව තොරතුරු රාශියක් දඹදෙණි අස්න[24] සහ කඳවුරු සිරිත වැනි ග්‍රන්ථ මඟින් ලබා ගත හැකි ය. දෙවැනි පැරකුම් කුමාරයා ඉගෙන ගත් දැ අතර ජ්‍යෝතිෂ්‍ය විෂය ද පැවැති බව පෙනෙයි. එම කුමාරයා ඉගෙන ගන්නා ලද ශිල්ප ශාස්ත්‍ර,[26] රජුගේ යුද්ධ සංවිධානය, සේනාවන් මෙන්ම ඇඳුම් පැළඳුම්, වස්ත්‍රාභරණ හා අවි ආයුධ පිළිබඳව දඹදෙණි අස්නේ නම් වට්ටෝරුවක් ඇතුළත් ය.[27]

දෙවැනි පැරකුම් රජු ද පැරණි සිංහල රජුන් සේ හිරු උදා වීමට පැය දෙකකට පෙර දවසේ වැඩ කටයුතු ආරම්භ කරයි. එමනිසා පාන් වීමට පෙර පැයකට පෙර පිබිද පළමුවෙන්ම පද්මාසනයෙහි හිඳ ත්‍රිලක්ෂණ භාවනා කර, ඉන්පසු පිරිත් සූත්‍ර කිහිපයක් සජ්ඣායනා කිරීමට මෙන්ම ධර්ම පාඨ ආදිය කටපාඩමින් කීමත් කරන බව කඳවුරු සිරිතෙහි දැක් වේ.[28]

මේ අතර පුරෝහිත බ්‍රාහ්මණයා මංගල සම්මත කුසතණ සහ මන්ත්‍ර ජලයක්, හක් ගෙඩියක් ගෙන ජයමංගල ගාථා කියමින් හක්ගෙඩිය පිඹිණු ලැබේ. ඉන් අනතුරුව රජතුමා ඉදිරියට පැමිණ ඔහු පසුදා රාත්‍රියේ රජු විසින් දකින ලද සිහින පිළිබඳ විමසා එම සිහින වලට සුදුසු ශාන්ති කර්ම කිරීමට එදිනම කටයුතු යොදයි.[29]

තවද රජු දහසය ආකාරයකින් වැඳ මල් පූජා කොට දළදා වහන්සේ ඉදිරිපිට දී සිල් සමාදන් වෙයි. මෙම අවස්ථාවේ දී පිරිත් පැන් පිළිගන්නා රජු ගිතෙල් පාත්‍රයෙන් මුහුණ බලා[30] පසුව පුරෝහිත බ්‍රාහ්මණයාගේ මංගල අෂ්ටක ශ්‍රවණය කර යහපත් ගුණධර්ම පුහුණු කර ටික වේලාවකින් පස්සේ මාලිගාවට යයි.[31]

නක්ෂත්‍රාචාර්යවරයා විසින් දහවල් ආහාරයට සුදුසු වේලාව දැන් වූ විට වෛද්‍යවරයාගේ උපදෙස් පරිදි පිළියෙළ කළ ආහාරය ගන්නේ මහාසංඝයා සියයක් නමකට දන් පිළිගැන් වීමෙන් අනතුරුව ය.[32]

විවිධ අභිචාර විධීන් රජු විසින් කර ඇත. ඒ අතරින් තෙල් පාත්‍රයෙන් මුහුණ බැලීම ආදී අභිචාර විධීන් හා ශාන්ති කර්ම කිරීම පෙන්වා දිය හැකිය. එය මානසික හා ශාරීරික සෞඛ්‍ය වර්ධනයට හේතු වේ.[33] මෙමඟින් සිංහල රජුන්ගේ දින චර්යාවෙන් ඔවුන්ගේ උදාරත්වයත් ශ්‍රේෂ්ටත්වයත් පැහැදිලි වෙන අතර භාරතීය හින්දු චාරිත්‍ර විධි අනුව රජු මනුෂ්‍යය රූපයෙන් සිටින දෙවියෙක් වශයෙන් පෙනෙයි.[34] මේ සඳහා අනුරාධපුර අවසාන අවධියෙහි සිට මෙරටට බලපාන ලද හින්දු බලපෑමත්, භාරතීය පාණ්ඩ්‍ය වංශිකයන්ගේ බලපෑමත්, බ්‍රාහ්මණ සංස්කෘතියට සම්බන්ධිත සංස්කෘත සාහිත්‍ය හා සිරිත් විරිත්වල බලපෑමත් යැයි පෙනෙන කරුණකි.[35] නමුත්

කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රය වැනි ග්‍රන්ථයන්හි දැක්වෙන රජුන්ගේ දින චර්යාව ඒ අයුරින්ම පැරණි සිංහල රජුන් භාවිත කළේ යැයි සිතිය නොහැකිය. නමුත් යම්තාක්දුරට හෝ හින්දුන්ගේ එකී ඉගැන්වීම් ලක්දිව රජදරුවන්ට බලපා තිබේ. කඳවුරු සිරිතෙන් පිළිබිඹු වන්නේ හින්දු චාරිත්‍ර වාරිත්‍ර හා ඉගැන්වීම් බෞද්ධ සිරිත් විරිත් හා ඉගැන්වීම් අනුව සකස් කර ගන්නා ලද පොදු දින චරියාවක් ලෙස යැයි සිතීමට ඉඩකඩ තිබේ.[36] මක්නිසාද යත් එහි අන්තර්ගත ඇතැම් සිරිත් වලින් එය පැහැදිලි වන හෙයිනි. ඒ අනුව රජු උදෑසනම පිබිදී භාවනා කිරීම දිනකට තුන් වතාවක් බුදුන් වැඳීම ආදිය මඟින් පෙනෙයි.

තවද කඳවුරු සිරිතෙහි දැක්වෙන රාජ දින චරියාවට භාරතීය දේශපාලන අදහස් ගැබ්ව ඇති බ්‍රාහ්මණ ඉගැන්වීම්වල බලපෑම්වලට ද ලක්ව ඇති බව කෞටිල්‍යයේ අර්ථ ශාස්ත්‍රයත් සමඟ සැසඳීමෙන් පැහැදිලි වේ.[37] ''දොරනා වැසි කුලයෙන් කිසිකෙනෙකු ලවා රිදි කටාරයෙන් නුවර පිරිත් පැන් ඉස්වනු ඉසා'' යැයි දළදා සිරිතෙහි සඳහන් වේ.[38] ''පිරිත් පැන් රන් කෙණ්ඩියේ ශ්‍රී මහා බෝධීන් වහන්සේට ඉසීම සූර්ය ගුප්ත කුමාරයාට පවරා කොතුරුගානා තනතුරු දුන් බව" මහාබෝධි වංශයේ සඳහන් වේ.[39] මෙමඟින් පෙනෙන්නේ ශ්‍රී මහා බෝධීන් වහන්සේට පිරිත් පැන් ඉසීම, නගරයට දළදා වහන්සේ වැඩම කිරීමට පෙර පිරිත් පැන් ඉස එම නගරය පිරිසිදු කිරීම රෝග අමනුෂ්‍ය භය ඇති වුණු විට දී නගරයට පිරිත් පැන් ඉස එකී භය දුරු කිරිම ආදීය කොට තිබේ. දඹදෙණි අස්නේ දැක්වෙන දොරනා තනතුර දළදා සිරිතේ එන ද්වාර නායක හෙවත් දොරටුපාලයාගේම තනතුර වශයෙන් කොන්ගන්තැන්නේ ආනන්ද හිමියන් පවසයි.[40]

දෙවැනි පැරකුම් රජු උදෑසනම අවදි වන අවස්ථාවෙහි බ්‍රාහ්මණයන් මංගල ඝෝෂා කිවූ බව "පුරෝහිත බ්‍රාහ්මණයන් විසින් එලවන ලද කුසතණ හා මන්ත්‍ර ජලයෙන් සඳහන් එකක් ගෙන ජල මංගල්‍ය ඝෝෂාවෙන්'[41] දැකුම් දී'' ''පෙරෙවී බමුණන් දුන් මන්ත්‍රාෂ්ටක ගෙන''[42] යනාදිය මඟින් පෙනේ. එමඟින් රජුගේ වස් දොස් දුරුවීමටත්, අභිවෘද්ධිය සැලසීමටත් හේතුවන්නා වූ හින්දූන්ගේ චාරිත්‍රයකි. විෂ්ණු දෙවියන් ආදීන්ගෙන් සෙත් පතා ලියන ලද ශ්ලෝක ජයමංගල ගාථා ආදිය මංගල අෂ්ටකවලට යොදා ගැනේ.[43] අබතෙල් පහන්, අමු

කපුරු පහන් ආදිය තියා තිබේ. අමු කපුරු වලින් ගන්නා ලද තෙල් වලින් පහන් දල්වන්නේ බෝධි පූජා, දළඳා පූජා, ග්‍රහ පූජා, දේව පූජා ආදියටය.[44] දෙවැනි පැරකුම්බාවන් ද පවත්වන ලද දළඳා පූජාවටත් අමු කපුරු පූජා පහක් තියා ඇති බව "ශ්‍රී දන්තධාතුන් වහන්සේට දොළොස් අවුරුද්දක් මුළුල්ලෙහි රෑ දාවල් නිරන්තරව තල තෙලින් පහනක් ද එළඟි තෙලින් පහනක් ද උරුලෑ තෙලින් පහනක් ද කපුරු තෙලින් පහනක් ද අමු කපුරෙන් පහනක් ද පැවැත්වාහුය'' යනුවෙන් දැක් වේ.[45] "පිරිත් පැන් ගෙන ගිතෙල් පාත්‍රය වත බලා''[46] යන මෙමඟින් ඇස්වහ කටවහ ආදී දෝෂ දුරු කර ගැනීම සඳහා පැරණි රජවරු යොදා ගත් සිරිතක් වශයෙන් පෙනෙයි.[47] එය හින්දූන් අතර පැවැති ආගමික චාරිත්‍රයකි.

''ඉටු දෙවියන් නැමද - පන්සිල් රැගෙන මනනද
රන්පය ගිතෙල සොඳ - බලා සියමුව තඹර මහරද[48]

''සොබමන් වන බඳන පිරූ සුවඳ ගිතෙල් තෙලෙන් ලකල
තඹවන් නරඹා සිරිදැක යළි පන්සිල් ගෙන මතු කළ",[49]

සූර්යෝද්ගමනයෙන් දොළොස් පැයක් හෙවත් පැය හතරක් සහ විනාඩි හතළිස් අටක් (පෙ. ව. 10. 48) රජු ප්‍රධාන වෛද්‍යවරයාගේ (වෙදනාවන්) දැකීමෙන් අනතුරුව අග්‍රභෝජනය සඳහා සුදුසු මොහොත දැනගන්නේය. එම නැකැත් තත්කාලානුකූලව විෂඝටික නම් වූ විෂ කලාවන්ගෙන් හා මරු පිහිටීම් ආදී දෝෂයන්ගෙන් තොර සුභ කලාවන් හෙවත් අමෘත කලාවන්[50] අනුව සකසයි. එසේ සකස් කර ගන්නා නැකත මහ නැකතිනාවන් විසින් දක්වන බව ''මහනැකතිකාවන් විෂඝටිකාදී දෝෂ රහිතව වේලාව ගැන් වූ කල්හි'' පෙනේ.[51]

දඹදෙණි අස්න හා කඳවුරු සිරිතෙහි පැරණි සිංහල රජවරු උගත් ශිල්ප ශාස්ත්‍ර පිළිබඳව ද තොරතුරු දක්නට ලැබේ. අකුරුවල නම් හා හෝඩිය, අකුරු ලියන ක්‍රමය, පොත් කියවීමේ ක්‍රමය හා ලිවීමේ ක්‍රමය ආදී සියලු අධ්‍යාපන කටයුතු භික්ෂූන් වහන්සේලා වෙතින්ම ලැබුණි. අධ්‍යාපනය මඟින් ධර්ම නීති, ලෝක නීති, රාජ නීති සම්බන්ධව උසස් දැනුමක් ලබා ගත් අතර අෂ්ටාදශ ශිල්පයන්හි

හා සිවුසැට කලාවන් සම්බන්ධයෙන් ප්‍රවීණත්වයක් ද ලබා ගත්හ. දඹදෙණි අස්නේ දෙවැනි පැරකුම් කුමාරයා අෂ්ටාදශ ශිල්පයන්හි හා සිවුසැට කලා ශිල්පයන්හි නිපුණත්වයක් ලැබූ බව සඳහන් වේ.[52] දෙවැනි පැරකුම් කුමාරයා එම අධ්‍යාපනය ලබා ගන්නේ එකල දඹදෙණියේ විජයසුන්දරාමාධිපතිවරයාණන් වහන්සේ වශයෙන් වැඩ වාසය කළ සංඝරක්ඛිත නාහිමිපාණන් වහන්සේ මගිනි. ''ධර්ම නීති, ලෝක නීති, රාජ නීති අක්ෂර ලිඛිතා දී නොයෙක් සිවුසැට කලා ශිල්පයන්හි දක්ෂ කරවා පරාක්‍රමබාහු නම් ජ්‍යෙෂ්ඨ ඈපාණන් සංඝරක්ඛිත නම් නාහිමියන් ආදීහු මහාසංඝයා කරා ගොස්.....''[53] යනුවෙන් පූජාවලිය පවසයි.

සිවුසැට කලා හා අෂ්ටාදශ ශිල්පයන් පිළිබඳව පැරණි සංස්කෘත, පාලි, සිංහල වැනි සාහිත්‍ය ග්‍රන්ථයන්හි විවිධ අවස්ථාවල දැක් වේ. ඒ අනුව සංස්කෘත ශබ්දකෝෂයක් වූ වචස්පත්‍ය හා විවේචන ග්‍රන්ථයක් වූ සාහිත්‍ය දර්ශනය[54] බ්‍රාහ්මණ තන්ත්‍ර ග්‍රන්ථයක් වූ ශෛව තන්ත්‍රය, දෙමළ සිංහල ශබ්ද කෝෂය, ජාතක අටුවා ගැටපදය,[55] පූජාවලිය,[56] දඹදෙණි අස්න[57] යන ඒවා පෙන්වා දිය හැකිය.

දඹදෙණි අස්නේ අෂ්ටාදශ ශිල්පය හා සිවුසැට කලාශිල්ප මිශ්‍ර වශයෙන් සඳහන් වේ. සංස්කෘත ග්‍රන්ථවල අෂ්ටාදශ ශිල්පය ඍග්, යජුර්, සාම, අථර්වන්, ශික්ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ති, ඡන්දස්, ජ්‍යෝතිෂ, මීමංසා, න්‍යාය, ධර්ම ශාස්ත්‍ර, පුරාණ, ආයුර්වේද, ධනුර්වේද, ගාන්ධර්ව, අර්ථ ශාස්ත්‍ර යනුවෙන් දැක් වේ. මීට බොහෝ සෙයින්ම වෙනස්කම් සහිතව අෂ්ටාදශ ශිල්පය සිංහල සාහිත්‍ය ග්‍රන්ථවල දැක් වේ.[58] සූසැට කලාශිල්ප දඹදෙණි අස්නේ දැක්වෙන්නේ ශිල්ප ශාස්ත්‍ර 58 කි. ඒවාද වාචස්පත්‍ය නම් සංස්කෘත ශබ්ද කෝෂයේ දැක්වෙන සිව්සැට කලා ශිල්පවලට වඩා බොහෝ සෙයින් වෙනස්ය.

**අග්නිස්ථම්භය (ගුප්ත විද්‍යා)**

වාචස්පත්‍ය නම් ග්‍රන්ථයේ ''අග්නිස්දාශක්ති නිරොදකෙ මන්ත්‍රෙ ඖෂධෙච''[59] යනුවෙන් දැක් වේ. මන්ත්‍ර හෝ ඖෂධ බලයෙන් ගින්නෙහි දාහ ශක්තිය වැළක්වීම අග්නිස්ථම්භය නමින් සඳහන් වේ.

පැරණි අධ්‍යාපනයෙහි වැදගත් විෂය ක්ෂේත්‍රයක් වශයෙන් මෙය රාජරාජ මහා මාත්‍යාදීන් මෙන්ම ප්‍රභූන් විසින් හැදෑරූ බව

සාහිත්‍ය ග්‍රන්ථ තුළින් පෙනෙයි.[60] මන්ත්‍ර හා ඖෂධ බලයෙන් ගිනි සිසිල් කිරීමේ ක්‍රමයක් පිළිබඳවත් එයට භාවිත කරන ''ගිනිසිසිල''නැමැති මන්ත්‍ර විශේෂයක් ද මන්ත්‍ර ශාස්ත්‍රයෙහි ඇතුළත් වේ. එයත් සිවුසැට කලාවන්ට ඇතුළත් වුණු අග්නිස්ථම්භ නම් පුරාණ භාරතීය ශාස්ත්‍රයෙහි විකාශනයක් විය හැකි යැයි කිව හැකිය.

**ආකර්ශනය**

මන්ත්‍ර බලයෙන් හෝ ඖෂධ බලයෙන් කිසියම් පුද්ගලයෙකු හෝ කිසියම් වස්තුවක් තමා වෙත ඇද ගැනීම යැයි වාචස්පත්‍යයෙහි විස්තර වේ. මෙයත් පැරණි භාරතීය අධ්‍යාපනයෙහි වැදගත් විෂය ක්ෂෙත්‍රයකි.[61]

**ආකාශගමනය**

අහසින් ගමන් කිරිම ''ආකාශ ගමනය'' වශයෙන් දැක් වේ. මෙයත් මන්ත්‍ර හෝ ඖෂධ බලයෙන් හෝ ඍද්ධි බලයෙන් හෝ අහසින් ගමන් කිරිම වශයෙන් දැක් වේ. පැරණි සාහිත්‍ය ග්‍රන්ථයන්හි ආකාශගමනය පිළිබඳ යම් යම් පුරාවෘත්ත දැක් වේ. ඒ අනුව, රාම, වෛශ්‍රවණගේ පුෂ්ක නැමැති ගගන යානයක් පිළිබඳ රාමායනයේ ද, නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ශිලා ලේඛනයේ ''ඔකාවස් රජ පරපුරෙහි වූ ආකාශචාරි කාලිංග චක්‍රවර්තීන් වහන්සේ .....''[62] යනුවෙන් ද සඳහන් වේ.

**කූප ශාස්ත්‍රය**

මින් ළිං කැණ වීමත්, ළිං පිළිබඳ සුභාසුභ පලාඵල පිළිබඳවත් උගැන් වේ. ජලය හිඟ වෙන ප්‍රදේශ, ළිදේ ස්වභාවය ගැඹුර ආදිය පිළිබඳව පැරන්ණන් නක්ෂත්‍රානුකූලව කරුණු පරීක්ෂා කළහ. එය සිවුසැට කලාවන්ට අයත් වූවකි.[63]

**ජලස්ථම්භය**

වාචස්පත්‍යයේ ''ජලස්ථම්භන සාධනෙ මන්ත්‍රාදෞ'' යනුවෙන් සදහන් වෙන අතර ඉන් ජල වේගය මන්ත්‍ර බලයෙන් නතර කරන ශාස්ත්‍රය පිළිබඳ උගැන් වේ.[64]

**ථෛනක පරීක්ෂාය**

ථෛනක යනු සොරාට කියන්නකි. මන්ත්‍ර බලයෙන් හෝ ඖෂධ බලයෙන් සොරුන් ඇල්ලීමේ ශාස්ත්‍රය යි.

**නක්ෂත්‍රය**

වේදාංගයක් වූ ජ්‍යොතිෂ් ශාස්ත්‍රයට සම්බන්ධ ඉගැන්වීම්ය. නක්ෂත්‍රයෙන් චන්ද්‍රයාගේ ගමන පිළිබඳවත්, අස්විද බෙරණ ආදී තාරකා පන්ති[27] පිළිබඳවත් උගැන්වේ.[65] නක්ෂත්‍රයෝ, පක්ෂය, තිථිය, නක්ෂත්‍රය, මුහුර්තය, කරණය පිළිබඳව කරුණු ගෙනහැර පායි.

**පත්‍රච්ඡේදනය**

මිත් කොළවල නොයෙක් රූප ඇඳීමෙන් හෝ කැපීමෙන් කරන ලද ක්‍රීඩාවක් යැයි ආරියපාල මහතා පවසතත්[66] පත්‍රච්ඡේදනය යන්න අභිචාර විධියක් වශයෙන් කෝන්ගස්තැන්නේ ආනන්ද හිමියන් පවසයි.[67] එනම් නොයෙකුත් මන්ත්‍ර සහ සම්බන්ධ අභිචාර ක්‍රම අනුව පත්‍ර සිදීමෙන් හෝ පත්‍රවල රේඛා ඇඳීමෙන් සතුරන්ට විපත් කිරීම, මිතුරන්ට සෙත් කිරීම, පිළිබඳ ඉගැන්වෙන ශාස්ත්‍රයක් වශයෙන් වේදාංගවලට අයත් වුණු පත්‍රච්ඡේදනය පැරණි රජ දරුවන් විසින් හාදාරා ඇත.[68]

**පරහිත ඥාණය**

අනුනට යහපතක් කිරීම පිළිබඳ නුවණ සහ අනුන්ගේ සිත් දැන ගන්නා ඥාණය මේ නම් වේ. පර ප්‍රවේශයයි ද විෂයයක් ද දක්නට ලැබේ. එමඟින් මන්ත්‍රාදී බලයෙන් හෝ ඖෂධ බලයෙන් අනෙකුගේ ඇඟට ආවේශ වීමේ හෝ ආරූඪ වීමේ අභිචාර ක්‍රමයක් ය. පරප්‍රවේශය මඟින් ආවේශ වී නොයෙකුත් වැඩ කර වීමත් රෝග උපද්‍රව පිළිබඳ තොරතුරු දැනගැනීමේ ක්‍රම යන්ත්‍ර මන්ත්‍ර ශාස්ත්‍රයට සම්බන්ධ වී තිබේ.

**ස්ත්‍රී ලක්‍ෂණ, පුරුෂ ලක්‍ෂණ, නපුංසක ලක්‍ෂණ**

වෙන් වෙන් වශයෙන් ස්ත්‍රී, පුරුෂ, නපුංසක ලක්ෂණ හඳුනා ගැනීමට ශාස්ත්‍ර පැවතිණි. ඒ අනුව මහාපුරුෂයන් පිළිබඳ උගැන්වෙන ශාස්ත්‍රය පුරුෂ ලක්ෂණ වශයෙනුත් කාන්තාවන්ගේ ගති හා පංච කල්‍යාණ ආදි ලක්ෂණ විස්තර කෙරෙන ශාස්ත්‍රය ස්ත්‍රී ලක්ෂණ වශයෙනුත් නපුංසක තැනැත්තන්ගේ ස්වභාවය විස්තර කෙරෙන ශාස්ත්‍රය නපුංසක ලක්ෂණ වශයෙනුත් සඳහන් වේ. තවද ඔවුන්නොවුන්ගේ ශරීර ලක්ෂණාදිය බලා සුභාසුභ පලාඵල ගෙනහැරපාන විශේෂ ශාස්ත්‍රයන් ද පැවැතිණි. එනම් අංගලක්‍ෂණ ශාස්ත්‍රයයි. මෙයටම සම්බන්ධ සාමුද්‍රිකා ශාස්ත්‍රය නමින් තවත් විෂයයක් සිවුසැට කලාවනට ඇතුළත්ව ඇත.

දඹදෙණි අස්නේ හා කඳවුරු සිරිතේ දෙවැනි පැරකුම්බා රජුට සේවය කරන ලද පඤ්ච ප්‍රධානීන්[69] ඇතුළු උසස් නිළධාරින් හා විවිධ රාජකාරී කටයුතු වල යෙදුණු සේවකයන් විශාල කොටසක් පිළිබඳ තොරතුරු දක්නට ලැබේ.[70] "අධිකාර, පඩිකා සිටින සෙනඟ, අධිකරණ නායක, අර්ථනායක, අරක්මේනා, ගජනායක, දහම්ගෙයිනා, දිසානායක, භාණ්ඩාගාරනායක, රටනායක, දොරනා, මහනැකතිනා, මහවෙදනා, මුලඟිනා, මහබෙළඳනා, කපුනා, කිලිනා, අගම්පඩි," දැක් වේ.

**මහනැකතිනා**

රාජමාලිගයේ මහා දෛවඥවරයා මහ නැකතිනා නම් වේ. වසරෙහි ලිත සකස් කිරීම ඔහුගේ ප්‍රධානතම රාජකාරිය විය.[71] රජුගේ වැදගත් ගමන් මෙන්ම කටයුතු ආරම්භ කිරීම, සිංහාසනාරූඪ වීම ආදියටත්, සුභ මුහුර්ත ඇති වේලාවන් සකස් කරලීමේ වගකීම පැවැරි තිබුණේ ද මහා නැකතිකාවන්ටය. ''දහම් පසක්නා. මහවියත්නා, මහ නැකතිනා, මහවෙදනා...'' යනුවෙන් කඳවුරු සිරිතේ ඇත.[72]

දඹදෙණි අස්න හා කඳවුරු සිරිතෙහි රජු හා රාජ්‍ය නිළධාරීන් ද, සේවක පිරිස් ද භාවිත කළ ඇඳුම් සහ ආභරණවල ලේඛනයක්[73] ඇති අතර රජතුමා සතියේ ඒ ඒ දිනයනට නියමිත ඇඳුම් හා ආභරණ වලින් සැරසි ඇත. නවග්‍රහයන් අනුකූල වනසේ සතියේ දින හතේ

රජතුමා ඇදුම් පැළඳුම් පරිහරණය කොට තිබේ. ජ්‍යෝතිෂයේ ඒ ඒ දින සඳහා වර්ණ දැක්වෙයි. එය පහත පරිදි දැක්විය හැකි ය.[74] ''ඉරිදා දවස් කුංකුමවර්ණ සළු වඩා පත්මරාග ආභරණ පැලැඳ සඳුන් කුංකුමාදිය අංගරාග ගල්වා මහනෙල් මල් පැලැඳ සඳුදා දවස් උව සුදු සළු වඩා මුතු ආභරණ පැලැඳ සඳුන් වඩා දෑ සමන්, ඉද්ද මල්, පැලැඳ අඟහරුවාදා දවස් උව රත්සළු වඩා ප්‍රවාලාභරණ පැලැඳ රත් සඳුන් තිලකාදී මහනෙල්, පලොල් මල් පැලැඳ බදාදා දවස් උව මරාවන් සළු වඩා මරකතාභරණ පැලැඳ සුවඳ හා සඳුන් විලවුන් ගෙන තමළුලිය මුසු මල් සෝලු පැලැඳ බ්‍රහස්පතින්දා දවස් රන්වන් පට වඩා පුෂ්පරාග ආභරණ පැළැඳ සුවඳ කොකුම් මුසු සඳුන් ගල්වා සපුමල් සෝලු පැලැඳ සිකුරාදා දවස් උව සුදුසළු වඩා විදුරු පලඳනා හෝ මුක්තාභරණ හෝ පැලැඳ කපුරු සුදු හඳුන් විලවුන් ගෙන මහනැකතිනාවන් විෂඝටිකාදී දෝෂ රහිතව වේලාව දැන් වූ කල්හි''

ඒ අනුව :-

ඉරිදා - කුංකුම වර්ණ සළු - පද්මරාග ආභරණය- සඳුන්, කුංකුම, අංගරාග, මහනෙල් මල්

සඳුදා - සුදු සළු - මුතු ආභරණ - සඳුන් දෑ සමන්, ඉද්ද මල්

අඟහරුවාදා - රත්සළු - ප්‍රවාලාභරණ- රත්සඳුන්, තිලක, මහනෙල් මල්, පලොල් මල්

බදාදා - මරාවන් සළු - මරකතාභරණ - සුවඳ සඳුන් විලවුන්, තමළුලිය මුසු මල් සෝලු

බ්‍රහස්පතින්දා - රන්වන් සළු- පුෂ්පරාග ආභරණ - සුවඳ කොකුම් සඳුන්, සපුමල් සෝලු

සිකුරාදා - සුදු සළු - විධුර පළඳනා, කපුරු, සඳුන් විලවුන් මුක්තාභරණ සීනිද්ද, සෙව්වන්දි, මල්කඩ

සෙනසුරාදා - නිල්සළු - ඉන්ද්‍රනීල ආභරණ- අංගරාග, නිලුපුල් මල්කඩ[75]

ඉතාමත් විනෝදාත්මක සැණකෙළියක් වන්නේ නැකැත් කෙළියයි. මෙම උත්සවය රාජකීය උත්සවයකි. ඇම්. බී. ආරියපාල මහතා මෙම නැකැත් සැණකෙළිය අතිශයින්ම විනෝදාත්මක එකක් මෙන්ම අනාචාරයට පවා තුඩු දෙන එකක් සේ සඳහන් කරයි.[76] මෙය රාජ්‍ය අණ පරිදි දින සතක් පුරාවට පැවැති අතර කෑම්, බීම්, නැටීම්, ගී කීම් ආදියෙන් සමන්විත ප්‍රීතිමත් උත්සවයකි. තරුණියන් ද රිසි සේ නිදහසේ හැසිරුණු අතර දිය කෙළි හා උයන් කෙළි ද අත්‍යවශ්‍ය වූවකි. පූජාවලියෙහි එන තොරතුරු මඟින් එය තවදුරටත් පැහැදිලි වේ.[77]

මෙම නැකැත් සැණකෙළිය පිළිබඳ අදහස් දක්වන මාර්ටින් වික්‍රමසිංහ මහතා කව්සිළුමිණෙහි එන උයන් දිය කෙළිය ද මේ සැණකෙළි විශේෂයම යැයි ද කාර්තිකෝත්සව යන්නෙන් දැක්වෙන්නේ ද මෙම උත්සවයටම යැයි ද සඳහන් කරයි.[78] තවද මහාවංසයේ එන චිත්තරාජ උත්සවය උයන් කෙළි හා සම්බන්ධ වූ සශ්‍රීකත්වය පිළිබඳව වූ පූජා විධියකැයි ද ඔහු සඳහන් කරයි. පරණවිතාන මහතා ද අදහස් කරනු ලබන්නා වූ මෙම චිත්තරාජ උත්සවය පැරණි රෝමාණුවන්ගේ සැටර්නේලියා (Saturnalia) නම් උත්සවය හා සමාන වූවකැයි ද කාර්තිකෝත්සව යන්නෙන් ද දැක්වෙන්නේත් මෙයම යැයි මාර්ටින් වික්‍රමසිංහ ද සඳහන් කරයි.[79]

බෝසතාණෝ තුසිත පුරයෙන් චුතව ඇසළ මස මැදි පොහෝ දින උතුරුසළ නැකතින් අලුයම් කාලයෙහි මහාමායා දේවින් කුස පිළිසිඳ ගත් දිනය ද කපිලවස්තු නම් නුවර ඇසළ කෙළි නැමැති උත්සවය පැවැති අවස්ථාවෙහි වූ බව පූජාවලියෙහි සඳහන් වේ.[80] තවද මෙම නකත් කෙළි උත්සවය අවුරුදු පතා සිදු කෙරෙන උත්සවශ්‍රීය මෙන්ම විනෝදාත්මක සැණකෙළියක් බව "එකල එනුවර අවුරුදු පතා කෙළෙනා වූ නකත් කෙළි නම් උත්සවයෙක් විය" යනුවෙන් පූර්වාරාම පූජා කථාවෙහි දැක්වීමෙන් පෙනෙයි.[81] එසේම බෝධිමණ්ඩල පූජා කථාවෙහි ද ''ඒ නුවර පළමු සත් දවසෙක පටන් ඇසළ කෙළි නම් වූ නකත් කෙළියෙක් විය. මනුෂ්‍යයෝ තමන් තමන් ගේ කර්මාන්ත හැර නුවරට වැද උත්සව කෙළි කෙළනාහු ය.'' යනුවෙන් තොරතුරු ඇතුළත් වේ.[82]

සද්ධර්මරත්නාවලියෙහි සාමාවතීන්ගේ කථාව එක් අවස්ථාවක නැකැත් කෙළියක් පිළිබඳව තොරතුරු''ඒ නුවර නකත් කෙළි නම් වූ සැණකෙළියෙක් විය. ඒ සැණ කෙළි දිනයෙහි උඩු මහලින් බිම් මහලට නොබස්න, බිම් මහලින් පිටතට නොනික්මෙන ඉසුරුමත් කුල ස්ත්‍රීහු පවා තම තමන්ගේ පිරිවර හා සමඟ පයින් ම නික්ම ගං හෝ ආදියට ගොස් සිත් සේ දිය කෙළ ඉස් සෝධා නහා මල් සුවඳ පැළඳ කෙළ ඇවිදිති'' යනුවෙන් දැක් වේ.[83] එමඟින් නකත් කෙළි නම් වූ සැණකෙළිය විනෝදාත්මක සැණකෙළියක් බව පැහැදිලි ය.

සද්ධර්මාලංකාරයේ, බෝධිවංශය[84] වැනි ග්‍රන්ථයන්හි ද දෙවනපෑතිස් රජු පවත්වන ලද නැකත් කෙළිය පිළිබඳ තොරතුරු සඳහන් වෙයි. ඒ අනුව දෙවනපෑතිස් රජු මුළු නුවර දෙව් පුරයක් ලෙස සරසා සැණකෙළි පැවැත් වූ අතර නුවර වැසියන් සහ මහ ඇමතියන්ට නැකැත් කෙළි කිරීමට නියෝග කොට මුව දඩයමේ ගියේ ය.[85] ඉන් පෙනෙන්නේ නැකැත් කෙළිය පොසොන් මාසයෙහි යම්කිසි නැකැත් යෝගයක් ආශ්‍රයෙන් සිදු කළ බවක් ය. මහාවංසයේ[86] දෙවනපෑතිස් රජු නගර වැසියන්ට දියකෙළි නියම කර ඔහු මුව දඩකෙළියට ගිය බව සඳහන් වෙයි. එහි සඳහන් තොරතුරු වලින් දියකෙළියක් යැයි ද කිය වේ. මෙමඟින් නැකැත් කෙළිය යන්නෙන් උයන් දිය කෙළියම යයි මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ මතය තහවුරු වේ.[87]

දඩයම් කිරීමට රජවරු විශේෂ කැමැත්තක් දැක් වූ ක්‍රීඩාවක් බව ජාතක කතා තුළින් පවා පැහැදිලි වේ. නමුත් බෞද්ධ රජවරු දඩයමට රුචියක් දැක්වූවා ද යන්න කීමට අසීරු වන්නේ ඔවුන් බෝධිසත්ව ගුණයන්ගෙන් යුක්ත වූවන් බව සලකන හෙයින් ය.[88] ජෝන් ඇම්. සෙනවිරත්න මහතා ලංකාවේ බුද්ධාගම පිහිටුවීමෙන් අනතුරුව මෙරට රජුන් දඩය මෙන් විනෝදය නොලැබූ බව පවසයි.[89] දෙවනපෑතිස් මුව දඩයමේ ගිය බව ඉහතින් සදහන් කරන ලදී. මෙය බුද්ධාගම වැළඳ ගැනීමට පෙර සිදු වූවකි. එහෙත් නිශ්ශංක මල්ල රජුගේ ගල්පොත ශිලා ලේඛනයෙහි[90] ඔහු ද දඩයමේ ගිය බවක් පෙනේ. චූලවංසයේ[91] මහා පරාක්‍රමබාහු රජු ද දඩයමේ ගිය අවස්ථාවක් පිළිබඳව තොරතුරු සඳහන් වේ.

සංස්කෘත කෘත්තිකා යන්නෙන් නම් ලත් කාර්තික උත්සවය ඉල් මාසයේ පැවැත් වෙන බව සද්ධර්ම රත්නාවලියෙන් පෙනේ.[92] නැකැත් කෙළි පොසොන් මාසයේ පවත්වන බව සද්ධර්මාලංකාරයෙන් පැහැදිලි ය. කව්සිළුමිණෙන් පෙනෙන්නේ නැකැත් කෙළිම යනුයි. වික්‍රමසිංහ මහතා සඳහන් කරන උයන් දිය කෙළි ශරත් ඍතුව ආරම්භයේදීම පැවැත්වුණු බවත් ය. මෙම උත්සව සියල්ලෙහිම පොදු ලක්ෂණ තිබිය හැකි වුවද මෙම උත්සව සියල්ලම එකම උත්සවයක් යැයි තවත් සාක්ෂි නොමැතිව නිගමනය කිරීමට අසීරු බව ආරියපාල මහතා සදහන් කරයි.[93]

ලක්දිව රාජ පෙළපත පිළිබඳ අවධානය යොමුකිරීමේ දී මෙරට මුල්කාලයේ රජවරු ඉන්දියාවේ රජුන් මෙන් විශේෂ ශුද්ධත්වයක් හෝ දේවත්වයක් ආරෝපණය නොගත් අතරම සූර්‍ය්‍ය වංශයෙන් හෝ චන්ද්‍ර වංශයෙන් පැවතෙන්නන් සේ නොසැලකූහ.[94] සූර්යයා යනු ග්‍රහ මඩුල්ලෙහි රජු වන අතර චන්ද්‍ර යනු ග්‍රහ මඩුල්ලෙහි බිසව වශයෙන් සලකයි. මොවුහු ග්‍රහ මඩුල්ලෙහි ප්‍රධාන ග්‍රහයෝ දෙදෙනෙකු වෙති. එහෙත් දහවැනි සියවසින් පසු මෙරට රජවරු චන්ද්‍ර වංශික හෝ සූර්‍ය්‍යවංශික යැයි උරුම කියන්නට පටන් ගත්හ. නවවැනි සියවසින් පසුව වැඩි නම්බුවක් හෝ කීර්තියක් අපේක්ෂාවෙන් ඔවුන් සූර්‍ය්‍ය වංශිකයන් යැයි කියා ගත් බව ආචාර්ය මැන්දිස්[95] මහතා පවසයි.

ඔක්කාක වංශිකයකු වශයෙන් දක්වන V වැනි කාශ්‍යප[96] තමා ක්‍ෂත්‍රියන්ට කොතක් බඳුයැයි වසයෙනුත් හතරවැනි මිහිඳු[97] ඔහුත් ඔක්කාක වංශිකයකු වශයෙන් අභිලේඛනයන්හි ගෙනහැර පා තිබේ. අට්ඨකථාවල දැකිය නොහැකි ශාක්‍ය වංශයෙහි ප්‍රභවය ගෙනහැරපාන සද්ධර්මරත්නාවලි කතුවරයා[98] මහාසම්මත රජුගේ පටන් මඛාදේව රජු තෙක්ම විස්තර කරයි. පූජාවලියේ[99] අම්බට්ඨ ශාක්‍ය වංශයේ රාජ පරම්පරාව ගෙනහැරපා තිබේ. චන්ද්‍ර වංශිකයකු වශයෙන් තමා කව්සිළුමිණ කතෘ දක්වයි. සූර්ය වංශිකයකු වශයෙන් පැරකුම්බා රජු සලකා මෙම කෘතිය එතුමාගේ කෘතියක් නොවන බව ඇතැම්හුගේ අදහසයි.[100] මානවම්ම ස්වකීය පෙළපත වශයෙන් ප්‍රථම වතාවට (ක්‍රි. ව. 676) මහාසම්මත පෙළපත ගැන සදහන් කරයි.[101] 15 වැනි 16 වැනි සියවස්වල දී ද හයවැනි භුවනෙකබාහු, මහාසම්මත රජුගෙන් අඛණ්ඩව පැවැත එන සූර්යවංශිකයෙකු[102] වශයෙනුත්

හත්වැනි භුවනෙකබාහු පල්කුඹුර සන්නසේ[103] තමා වෛවස්වත මනු නම් මහාසම්මත රජුගේ පරම්පරාවෙන් පැවැත එන බව සඳහන් කිරීමෙන් ද පෙනෙන්නේ මෙකල ද පැවැති බවය. සද්ධර්මාලංකාරයේ මහාසම්මත රජු සූර්‍ය්‍ය දිව්‍ය රාජයා නිසා ශ්‍රී කාන්තාව ලැබූ පුත්‍රයා වශයෙන් දක්වා තිබේ.[104] මෙම මතය බෞද්ධ නොවන්නකි.[105]

බුදුරදුන්ගේ පරම්පරාව ගෙනහැර පෑමේ දී මහාවංසයේ ප්‍රථමයෙන්ම මහාසම්මත රාජවංශය[106] ගැන සදහන් කරයි. මෙරට රජුන් ද මහාසම්මත වංශයට සම්බන්ධ බව කීමට උත්සහ ගන්නේ බෝධිසත්වයන් වශයෙන් ඔවුන් සැලකීමට ගත් පසුව බව සිතීමට අවකාශ තිබෙන බව ආරියපාල මහතා සඳහන් කරයි.[107] ඔවුන්ගේ රාජාවලිය ඇරඹෙන්නේ ද මහා සම්මත පරම්පරාව පිළිබඳ දීර්ඝ විස්තරයකින් ය.

ඉහත සදහන් කරුණු තුළින් බෞද්ධාගමික පරිසරයක් තුළ වුව ද රාජත්වය, අභිෂේකය ආදිය පිළිබවඳව පුරෝහිතයන්, බමුණන් ආදීන් සම්බන්ධ වීමෙන් ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රයෙහි එන යම් යම් දෑ මේ හා සම්බන්ධව තිබෙන බවක් පෙනෙයි.

## ආන්තික සටහන්

1. රජ කෙනෙකුගේ අග්‍ර උපදේශක පදවිය පුරෝහිත තනතුරත ප්‍රධාන අනුශාසක පදවිය.
2. පෙරෙවිකම, අමාවතුර, සංස්. කෝදාගොඩ ඥාණලෝක හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959, පි. 179.
3. රජ කෙනෙකුට සිටින පුරෝහිත බමුණා, පුරෝහිත බ්‍රහ්මණයා, රජුගේ ප්‍රධාන උපදේශකයා.
4. පුරෝහිත බ්‍රාහ්මණයා, අමාව, පි. 89; සද්ධර්මරත්නාවලිය, සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2007, පි. 705.
5. පැරණි රජවරුන්ගේ ප්‍රධාන උපදේශකයාත බමුණන් අතර අග්‍රස්ථානය ලද බමුණා, රුවන්මල් නිඝණ්ටුව හෙවත් නාමරතන මාලාව, සංස්. ඩී.පී. ද අල්විස් විජයසේකර, විද්‍යාසාගර යන්ත්‍රාලය, 1914, පි. 328.
6. පන්සිය පනස් ජාතක පොත, සංස්. ජී. එප්. මුණසිංහ අප්පුහාමි සහ ඩී. ඩබ්. සිරිවර්ධන අප්පුහාමි, ජනාලංකාර මුද්‍රණාලය, මහාසුපින ජාතකයල 1927.

7. ඌනපූරණ සහිතො මහාවංසො, (ඌපූම) සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959, පරි. 7. ගා. 44ග

8. එම, පරි. 8, ගා. 4.

9. එම, පරි. 9. ගා. 2.

10. Robet Lingat, Rouautes Bouddhiques Asoka et la function Royal a Ceylon, paris: Editions de I ecoledes Hautes en Sciences Sociales, 1989, p.175, යන්නෙහි ඇති බව ධීරානන්ද හිමි ගෙනහැර පායි. හගුරන්කෙත ධීරානන්ද හිමි, රාජත්වය, රාජ්‍යය සහ ආගම, වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ, 2004, පි. 461.

11. එම.

15. ධීරානන්ද හිමි, එම, 2004, පි. 461.

16. ''.....තදා පන තස්ස රඤ්ඤො විසාඛ පුණ්ණමායං අභිසෙකස්ස කත්තනා තතොප්පභූති යාවජ්ජතනා විසාඛ පුණ්ණමායමෙව අභිසෙකකරණ මාචිණ්ණං.....'', සාදී, පි. 139.

17. ''.....පුන්සඳ නැගැ පානා සේ ශුභ නකත් මොහොත්හි මුහුනු පිටැ මඟ පෙතැ නිරුපද්‍රව කොටැ'' Epigraphia Zeylanica" Vol. II, ed¡ D. M. D. Z. Wicramasingha, London: Oxford University Press, 1928, p. 223.

18. '' බිනෙර පුර දොළොස්වක් ලද බදා දවස් ශුභ නකත් මොහොතින් අභිෂේක කැරැ වූ.....'' Ibid.

19. ''නක්ඛත්තෙන පසත්තෙන - දිනෙ මංගල සම්මතෙ ධාරෙත්වා සිරසා මොලිං - සබ්බාභරණභූසිතෝ, ඌපූම, පරි. 69. ගා. 28, පි. 409.

20. මහාවංශය (සිංහල), සංස්. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012, පි. 486.

21. ලියනේගම චන්දසිරි හිමි, ලක්දිව අභිෂේක මංගල්‍යය, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2007, පි. 50.

22. එම.

23. එම.

24. දඹදෙණි අස්නේ අන්තර්ගත වන්නේ දෙවැනි පරාක්‍රමබාහු කුමාරයා අෂ්ටාදශ ශිල්ප හා සූසැට කලාශිල්ප ඉගෙන දඹදෙණියෙහි රාජ්‍යත්වයට පැමිණීමත්, දෙමළ සේනාවක් රැගෙන කලිඟු රටින් පැමිණි කාලිංග රජතුමාත්, තමලංග මුවෙන් පැමිණි රජතුමාත්, ජුවන්කරයේ ජාවක රජු පරාජය කිරීම මෙන්ම

සතුරන්ට එරෙහිව සටන් 12 ක් කිරීමත්, සත්‍ය ක්‍රියා බලයෙන් දළඳා වහන්සේගේ ප්‍රාතිහාර්‍ය්‍ය පෑමත් මේ රජු විසින් ශාසනයෙහි අභිවෘද්ධිය සඳහා කරන ලද කටයුතු ආදියයි; දඹදෙණි අස්න සහ කඳවුරු සිරිත, සංස්. කොන්ගස්තැන්නේ ආනන්ද හිමි, මාතරඃ රුහුණු විශ්වවිද්‍යාලය, 1997, පිටු. 18.

26. ''ග්‍රන්ථය, නාගරය, දෙමළය, සිංහලය, නිඝණ්ඩුය, කසයින් ව්‍යාකරණය, මුගලන් ව්‍යාකරණය, මගධය, සංස්කෘතය, නිසබණය, තෙරබණය, විනය පිටකය, සූත්‍රපිටකය, අභිධර්ම පිටකය, අංගෝත්‍ර සඟිය, මැදුම් සඟිය, ධාතුපාඨය, ඡන්දොලක්‍ෂණය, ත්‍රිවේදය, නක්‍ෂත්‍රය, ශික්ෂාය, මොක්ෂය, සිරිතය, කඩු සරඹය, පළඟ සරඹය, නෙත්තම්, රාජවිල්, දොළොස්භාෂාය, ධනුශ්ශිල්පය, සාමුද්‍රිකා, පරකතාය, නීතිශාස්ත්‍රය, තර්කය යන ආදී අෂ්ටාදශ ශිල්පයෙහි හා ඉතිහාසය, පුරාණය, අග්නිස්ථම්භය, ජලස්ථම්භය, සූපශාස්ත්‍රය, උද්ධාටනය, ත්‍රෝටනය, දූරගමනය, දූරදර්ශනය, භෙරිත්‍රොටනය, පත්‍රච්ඡේදනය, චිත්‍රකර්මය, දූතය, භරතය, ස්ත්‍රි ලක්ෂණය, පුරුෂ ලක්ෂණය, නපුංසක ලක්ෂණය, පරහිතඥාණය, කණකපරික්ෂාය, ධෙනපරික්ෂාය, ආකර්ශනය, ආකාශගමනය, කාෂ්ටකර්මය, හෙම කර්මය රතනපරික්ෂාය යන ආදී සූසැට කලා ශිල්ප උගන්නා වූ මේ රජ", එම, පිටු. 39-41.

27. දඹදෙණිඅ, පිටු. 48-50.

28. කඳවුරුසි, පි. 67.

29. "පහන්වන්නට පළමු පස් පැයක් තබා ප්‍රබුද්ධව ශ්‍රී යහන් මැද පද්මාසනයෙහි වැඩ හිඳ අනිත්‍ය, දුක්ඛය, අනාත්මය යන ත්‍රී ලක්ෂණය භාවනාවෙන් යෙදී තුන් පැයක් පුරා සූත්‍ර බණ සිහිකර වැඩහුන් කල්හි පුරෝහිත බ්‍රාහ්මණයන් විසින් එළවන ලද කුසතණ හා මන්ත්‍ර ජලයෙන් යුත් පතක් ගෙන ජයමංගල්‍යය ඝෝෂාවෙන් දැකුම් දී සක අත් පහරවා මන්ත්‍ර බැණ ස්වප්න විචාරා ඊට නිසි ශාන්ති විධි.'' එම.

30. කඳවුරුසි, පිටු. 68-69.

31. ''පෙරෙවි බමුණන් දුන් මන්ත්‍රාෂ්ටක ගෙන'', එම, පි. 69.

32. ''මහනැකතිනාවන් විෂඝටිකාදී දෝෂ රහිතව වේලාව දැන් වූ කල්හි'', ඳවුරුසි, පිටු. 70- 71.

33. කඳවුරුසි, පි. 72.

34. ''බාලොපි නාවමන්තවේ‍යා මනුෂ්‍ය ඉති භූමිපඃ මහතී දෙවතාභ්‍යොෂා නරරූපෙණ තිෂ්ඨති, හිතෝපදේශය, 85 පද්‍ය, පි. 215.

35. නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ශිලා ලේඛනයේ රජු නැති අවස්ථාවක

අඟබිසව හෝ ඇයත් නැතිවිටෙක රජුගේ පාවහන් යුවල හෝ සිංහාසනයේ තබා රාජ්‍යයෙහි කටයුතු පැවැත්විය යුතු යැයි දැක් වේ. එසේම හත්ථවනගල්ල විහාර වංශයේ මියගිය රජුගේ සිරුර ස්පර්ෂ කිරීමට ගැමියන් බිය වූ බවක් ද සඳහන් වේ. ''ඔටුනු පලන් රජුහුගේ ද බිසවගේ ද ශරීර අප වැන්නවුන් ස්පර්ශ කරන්නට ද අල්වන්නට ද සුදුසු නොවෙයි. දැන් රජ කරන රජ්ජුරුවන් වහන්සේට නොදක්වා ආදාහනකෘත්‍යය කරන්නට ද සුදුසු නොවන්නේය'', එළු අත්ත, පි. 37

36. <u>දඹදෙණිඅ</u>, පි. 35

37. දිවසම්‍යෂ්ඨභාගෙ රක්ෂාවිධාන මායව්‍යයෞච ශෘණුයාත්, ද්විතීයෙපෞරජානපදානඃ-කාය්‍යානී පශ්‍යෙත්. තෘතීයෙ ස්නාන භොජනංසෙවෙත, ස්වධ්‍යායංච කුර්වීත චතුර්ථෙ හිරණ්‍ය මධ්‍යස්ෂශ්ච කුර්විත පංචමෙ - බොධනියානි බුද්ධයේත්, ෂෂ්ටේ සෛවරවිහාරං මන්තංවා සෙවෙත, සත්තමෙ හ්‍යස්ථ්‍යශ්වරථායුධීයාත් පශ්‍යෙත්, අෂ්ඨමෙ සෙනාපති සඛො වික්‍රමං චින්තයෙත් ප්‍රතිෂ්ඨී තෙනහි සන්ධ්‍යාමුපාසිත.

'' ප්‍රථමෙ රාත්‍රිභාගෙ ගූඨපුරුෂාන් පශ්‍යෙත් දිවිතීයේ ස්නාන භොජනං කුර්විත. සවාධ්‍යායං ච තෘතියෙ තුර්ය ඝොෂෙන සංවිශ්චතුර්ථෙ පඤ්චමෞ ශයීත, ෂෂ්ටෙ තුර්ය ඝොෂෙණ ප්‍රතිබුද්ධඃ ශාත්‍රමිති කත්‍යතාංච චින්තයේත්, සත්තමෙ මන්ත්‍රමධ්‍යායිත, ගූඨපුරුෂාශ්චප්‍රෙක්ෂෙත්අෂ්ටමේ ඍත්විගාචාර්ය, පුරෝහිත සඛඃ ස්වස්ත්‍යයානි ප්‍රතිගෘහ්ණීයාත් චිකිත්සකමාහාතසිත මහුර්නිකාශ්ච පශ්‍යෙත්ස්වත්සාංධෙනුං වෘෂහංච ප්‍රදක්ෂිණීකෘත්‍යොපසීථානං ගච්ඡෙත් '', කෞ.අ.ශා. අධ්‍යාය 74 - පි. 78.

38. <u>දළදා</u>, පි. 52.

39. <u>බෝධි</u>. පි. 220.

40. <u>දඹදෙණිඅ</u>, පි. 85.

41. <u>කඳවුරුසි</u>, පි. 67.

42. එම, පි. 69.

43. ලං. ඉති. පි. 685.

44. <u>දඹදෙණිඅ,</u> පි. 126

45. <u>දඹදෙණිඅ</u>, පි. 60.

46. <u>කඳවුරුසි,</u> පි. 68.

47. <u>දඹදෙණිඅ,</u> පි. 132.

48. කා. සේ, පි. 8-12.

49. කව්මිණි කොඩල, පි. 35.

50. ඇපා පංචාංග ලිත. 1980-81, පි. 4.

51. කඳවුරුසි, පි. 71; ලං. ඉති. පි. 687.

52. "බාල වයස අකුරු කරවන්නාහු ග්‍රන්ථය, නාගරය, දෙමළය...... යනාදී අෂ්ටාදශ ශිල්පයන්හි හා ඉතිහාසය, පුරාණය............. යන ආදි සිවුසැට කලා ශිල්පයන්හි'', දඹදෙණිඅ, පි. 39.

53. පූජා. පි. 787.

54. සා.ද. පි. 7.

55. ජාතක අටුවා ගැටපදය, 1967. සංස්. මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි සහ නැහින්නේ සෝමිස්සර හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, පි. 77.

56. පූජා. පි. 151.

57. දඹදෙණිඅ, පි. 40.

58. පූජා,පි. 134,සද්ධ,පිටු. 98-99, ජාඅගැ, පි. 77.

59. වචස්. පි. 61.

60. පූජාවලිය, සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2008, පි. 135; සද්ධර්මාලංකාරය, සංස්: මකුළුදූවේ පියරතන හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1971, පි. 98; දඹදෙණිඅ, පි. 40.

61. පූජා,පි. 135; සද්ධ, පිටු.98-99; දඹ. අ. පි. 40.

62. Epigraphia Zeylanica" Vol. III, ed¡ S. Paranavitana, London: Oxford University Press, 1933, p. 104'

63. පූජා, පි. 151; සද්ධ, පි. 99; දඹදෙණිඅ. පි. 40.

64. වාචස්ප, පි. 3072.

65. ජාඅගැ, පි. 71.

66. ඇම්. බී. ආරියපාල, මධ්‍යකාලීන ලංකා සමාජය, 13 ශතවර්යට අයත් සද්ධර්මරත්නාවලියෙහි හා වෙනත් සාහිත්‍ය කෘතිවල නිරූපනය වන ලංකා සමාජයේ තත්ත්වය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1962, පි. 268.

67. දඹදෙණිඅ. පි.79.

68. දඹදෙණිඅ, පි. 40. සද්ධ, පි. 99, පූජා. පි. 151.

69. රජ, යුවරජ, සෙනෙවිරත්, සිටු, ඈපා හා මාපා යන පස්දෙනාය පංච ප්‍රධානින් ලෙස නිකාය සංග්‍රහයේ සඳහන් වන්නේ පහත පරිදිය.'' ශ්‍රී ලංකාද්වීපයේ බහුනායකත්වය නොකෙරෙන සේ රාජතන්ත්‍රය පවත්වමියි සිතා අධිකාර, සෙනෙවිරත්, ඈපා, මාපා, මහලැන''ආදී වශයෙනි.; නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය, සංස්. බන්දුසේන ගුණසේකර, කොළඹ: ඇස්. ගොඩගේ සහ ප්‍රකාශන, 1984, පි. 35; ලං.ඉති. 1972, (ලංකාවිශ්ව) පි. 691.

70. දඹදෙණිඅ, පිටු. 53-54; කඳවුරුසි, 71-72 ''..... නැකැත්තෝය, වෙදවරුය,.....'' දඹදෙණිඅ, පි. 54.

71. ලං. ඉති. පි. 687.

72. කඳවුරු සිරිත, පි. 72

73. " රජ ආදී සිරිත් නවග්‍රහයන්ගේ ගෝචර නියාවට සැරසුනා වූ වස්ත්‍රාභරණ නම්....'' දඹදෙණිඅ, පිටු. 47-51.

74. එම, පි. 70.

75. දඹදෙණිඅ, පි. 104.

76. ආරියපාල, එම, 1962, පි. 345.

77. ''එදා මතු මාලෙන් යටිමාලට නොබස්නා යටි මාලෙන් එළිපත පැන පිටතට නොයන කුල ස්ත්‍රි තමන් තමන්ගේ ගෙවලින් නික්ම පිරිවර හා සමඟ සියලු සතුන්ටම පෙනී පෙනී උයන් පොකුණු ගංගොට ආදී යෙහි සිත් සේ කෙළමින් සෙමින් ඇවිදිනාහු ය. එ දවස් රජ බමුණු වෙළඳ ගොවි සිවු කුලයෙහි ශ්‍රිමත් වූ සල්ලාල පුරුෂයෝ අද අප හා සමාන කුල ඇති උත්තම ස්ත්‍රීන් සිත් සේ බලම්හයි සුවඳ මල් කඳු ගෙන ඒ ඒ සන්ධියෙහි සිටගෙන කැමැති කැමැති කුල ස්ත්‍රීන් කරට මල්දම් දම දමා සිත් සේ කෙළනාහු ය.'' පූජා, පි. 329.

78. එම, පි. 345.

79. මාර්ටින් වික්‍රමසිංහ, පුරාණ සිංහල ස්ත්‍රීන්ගේ ඇඳුම, මහරගම, සමන් මුද්‍රණාලය, 1950, පිටු. 62, 64.

80. පූජා, පි. 126.

81. එම, පි. 347.

82. එම, පි. 166.

83. සර, පි. 222.

84. ''සියලු ලඞකාද්වීප වාසි වූ සත්වයන් උත්සව කෙළි කෙළනා පරිද්දෙන් නක්‍ෂත්‍ර ඝෝෂණය කරවා පුරවාසී වූ සත්ත්වයන් නකත් කෙළි කෙළනට පටන් ගත් කල්හි'', බෝධිව, පි. 147.

85. ''අප බුදුන් පිරිනි වී දෙසිය සතිස් වන හවුරුදු ධර්මාශෝක රජ හට අටළොස් වන්නෙහි දෙවන පැතිස් රජ හට පළමු වන්නෙහි එම මිහිඳු තෙරුන් වහන්සේ උපසම්පදා වූ දොළොස් වන හවුරුදු පොසොන් පුර මූල නකත ලද පසළොස්වක් දවස යැ. එසේ හෙයින් දෙවනපැතිස් රජ්ජුරුවෝ පළමු සත් දවසක පටන් මුළු නුවර දෙව් පුරයක් සේ සරසා සැණකෙළි කෙළනාහු ඒ දවස් නුවර වැසියන් හා මහ ඇමතියන් නකත් කෙළි කෙළනා සේ නියෝග කොට තුමු සතිළිස් දහසක් පුරුෂයන් පිරිවරා මිහින්තලාවට මුව දඩ ගියහ.'' සද්ධලං, පි. 349.

86. මහාවංශය (සිංහල), සංස්. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012, පි. 50; උෟපූම, පරි. 14. ගගා.1ග

87. ආරියපාල, එම, 1962, පිටු. 345-346.

88. එම, පි. 39.

89. JRAS (CB), No. 71, Part II, p. 133.

90. '' ක්‍රීඩා වනයෙහි ඉදිරියට කකාරා පිනු කුරිරු වැලසින්න දිවු කැඩී සිය පිළුන් හා සැමැගැ පාපිට හෙළු'' EZ" 2. 3. 105.

91. ''ඉක්බිති රජ තෙමේ එක් දිනක් අමාත්‍යයන් හා ජනයා විසින් පිරිවරන ලදුව මෙහෙසියන් සමඟ මුව දඩයම පිණිස ගියේ යත මෘගයන් ප්‍රවිෂ්ට වූ ලකුණු ඇති එක් මහවනයක් දුටු ඒ බුවිපල් තෙමේ මෙහෙසිය එක් අවකාශ ස්ථානයෙක් හී හිඳුවා, ශස්ත්‍ර හස්තවන් වූ හෙවත් තෙප් ගත් අත් ඇති ව්‍යාධ පුරුෂයන් ලවා ඒ වනය මුව දැලින් අවුරවා ඔවුන් රැකවල් පිණිස සිටු වුයේයත මෙසේ කොට මිනිසුන් ලවා මහත් වූ ඝෝෂා කරවිය. ඒ උද්ඝෝෂණයෙන් බියෙන් තැතිගනු ලැබූ හස්ති පෝතකයෙක් පමණ මහත් වූ ගෝණෙක් වන ගුම්බයෙන් නික්ම .... මෙහෙසිය අභිමුවට දිව ආයේ ය... රජතෙමේ දිව එන්නා වූ බියකරු වූ ඒ ගෝණාගේ ඉදිරියට (වේගයෙන්) දිව අවුත් තෙබ දමා ඇන්නේ යත ඒ රජහු විසින් අන්නා ලද පහර ලැබත් අනින පිණිස හිස නමන විට සිගුයුවල ගිලිහී රජහු පාමුල හින්''මහාවංශය, සිංහල පි. 280.

92. සර, පි. 818.

93. ආරියපාල, එම, 1962, පි. 347.

94. H. Ellawala, Social History of Early Ceylon, Colombo: Department of Cultural Affairs, 1969, p. 29. 95 Ibid, p.54.

96. Epigraphia Zeylanica" Vol. I, ed¡ D. M. D. Z. Wicramasingha, London: Oxford University Press, 1912, p. 43.

97. Ibid.1.3.115.

98. <u>සර,</u> පි. 312.

99. <u>පූජා</u>, පිටු. 108-115.

100. ආරියපාල, එම, 1962, පි. 26.

101. චූව, පි. 47. 2.

102. 'සවසති ශ්‍රී මහාසම්මත පරම්පරානුයාත සූර්‍ය්‍යවංශොද්භූත ශ්‍රී පරාක්‍රමබාහු මහා රාජාධිරාජ නන්දන ත්‍රිසිංහලාධීශ්වර නවරත්නාධිපති ශ්‍රීමත් සිරිසඟ බෝ ශ්‍රී භුවනෛකබාහු....', EZ, 3. 5. 281.

103. Ibid, 3. 5. 244

104. ''ප්‍රථම අන්තඃ කල්පයෙහි සූර්‍ය්‍ය දිව්‍ය පුත්‍රයා ශ්‍රී කාන්තාව හා සංගමය කළ කල්හි ලෝකයෙහි පහළ වූ යයි යන පරමතය හේතු කොටගෙන සූර්‍ය්‍ය යයි කියන ලද මහාසම්මත නම් වූ ඕපපාතික රජෙක් විය'', සද්ධලං, (සද්ධාතිස්ස සං.) පි. 131.

105. <u>ආරියපාල,</u> එම, 1962, පි. 26.

106. <u>මහා,</u> 2. 1.

107. <u>ආරියපාල,</u> එම, 1962, පිටු. 26-27.